ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 26/10/21.

පැමිණිලි පාර්ශවය : ඩබ්.එච්. මාලනී මිය,
අංක 430/1, ඒ,
වටරවුම් පාර,
නල්ලුරුව, පානදුර.

අගතියට පත් අය : ඩබ්.සී ප්‍රියංකා චාමින්දනී ප්‍රනාන්දු

වගඋත්තරකාර පාර්ශවය : ප්‍ර.පො.ප සුනෙත් ශාන්ත මයා,
දිසා අපරාධ ඒකකය,
පොලිස් ස්ථානය,
වාද්දුව.

**පැමිණිලි අංකය : HRC/2557/16**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2016.06.29 වන දින තම දියණිය වන ප්‍රියංකා නැමැති අයව සොයා සිවිල් ඇඳුමින් සැරසුණු නිලධාරීන් දෙදෙනෙකු පැමිණි අතර, එදින දියණිය නිවසේ නොසිටි බැවින් 2016.06.30 වන දින වාද්දුව පොලිස් ස්ථානයට පැමිණෙන ලෙසට දන්වන ලද බවයි. ඒ අනුව 30 වන දින පෙ.ව 9.30 ට පමණ පැමිණිලිකාරියත් ඇයගේ දියණිය වන ඩබ්.සී ප්‍රියංකා චාමින්දනී යන අයත් පැමිණිලිකාරියගේ ලේලිය වන ශාන්ති යන අයත් සමඟ වාද්දුව පොලිස් ස්ථානයට ගිය බවත්, එහිදී CI සුනෙත් මහතා හමුවූ අතර එම නිලධාරියා පෙර දින තම නිවසට පැමිණි නිලධාරියා බවට හඳුනාගත් බවත්, ඉන් පසුව දියණියව රඳවාගෙන පැමිණිලිකාරියට එම ස්ථානයෙන් යන ලෙසට දැන්වූ බවත්, පෙ.ව 11.00 ට පමණ දියණියට කෑම රැගෙන ගිය බවත් සඳහන් කර ඇත. එවිට පොලිස් නිලධාරීන් "තම දියණිය අනිල් නැමැති අයගෙන් රු. 3000/- ක මුදලක් ලබාගෙන ඇති බවත්, එම මුදල් ලබාදුනහොත් නිදහස් කළ හැකි බවත්" තම දියණිය හට පවසා තිබූ බවද දක්වා ඇත. තවද තම දියණියට ස්වභාවයෙන්ම කතා කිරීමේ අපහසුතාවයක් ඇති බවත්, ඒ හේතුවෙන් ඇයට අපහාස කරමින් නිලධාරීන් කටයුතු කර ඇති බවද ප්‍රකාශ කර ඇත. ඉන් පසුව පානදුර දකුණ පොලිස් ස්ථානයට රැගෙන ගොස් ප්‍රකාශයක් සටහන් කරගෙන ඊට අත්සන් ලබාගෙන ඇති අතර, ඇයට ලිවීමට හෝ කියවීම හැකියාවක් නොවන බැවින් එම ප්‍රකාශය කුමක්ද යන්න ඇය නොදන්නා බවත්, පසුව සවස 4.30 ට පමණ වාද්දුව පොලිස් නිලධාරීන් විසින් ත්‍රීවිල් රථයක නංවාගෙන විත් නැවත නිවස ළඟින් බස්සවා ඇති බවත් සඳහන් කර ඇත.

අගතියට පත් **ඩබ්.සී ප්‍රියංකා චාමින්දනී** යන අය කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් ප්‍රකාශ කර ඇත්තේ, 2016.07.30 වන දින පෙ.ව 9.30 ට පමණ වාද්දුව පොලිස් ස්ථානයට ගොස් සුනෙත් මහතා හමුවූ අතර, එහිදී තම මවට සහ නැනාට එම ස්ථානයෙන් ඉවත් වන ලෙසට දැන්වීමෙන් අනතුරුව එම ස්ථානයේ සිටි අනිල් නැමැති අයගෙන් රු. 3000/- ක මුදලක් තමා විසින් ලබාගත්තාදැයි විමසා සිටි බවත්, එවැනි මුදලක් ලබා නොගත් බවට ප්‍රකාශ කිරීමෙන් පසු අසභ්‍ය වචනයෙන් බැණවැදුනු බවත්, නොයෙකුත් අපහාස කළ බවත්, පිපාසය හැදුනු විට



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

කිහිප වරක් තමා විසින් වතුර ඉල්ලූ විට එක් වරක් වතුර ලබා දී ටැප් එකට ගොස් වතුර බොන ලෙසට දැන්වූ බවත්, සඳහන් කර ඇත. එහිදී තමා හෘද රෝගියෙකු බවත්, ඒ සඳහා ප්‍රතිකාර ලබා ගන්නා බවත් ඔවුන් හට පැවසුවද ඒ සම්බන්ධයෙන් කිසිදු තැකීමකින් තොරව තමාව පානදුර පොලිස් ස්ථානයට රැගෙන ගොස් කොලයක යමක් ලියා අත්සන් ලබාගත් බවත්, එහි සඳහන් කළ දෙය තමා නොදන්නා අතර, හාමුදුරුවන් සමඟ රණ්ඩුවට නොයන ලෙසට තමාට දැන්වූ බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකාරිය සිය පැමිණිල්ල සනාථ කිරිම සඳහා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අතර, අගතියට පත් ප්‍රියංකා චාමින්දනී ප්‍රනාන්දු යන අයද අදාළ සිද්ධිය සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත. ඊට අමතරව මීෂේවාරිගේ ශාන්ති යන අය විසින්ද දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත.

මීෂේවාරිගේ ශාන්ති යන අයගේ දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ, පැමිණිල්ලේ සඳහන් කළ ආකාරයට 2016.06.29 දින වාද්දුව පොලිස් ස්ථානයේ නිලධාරීන් පිරිසක් පැමිණ සුනෙත් නැමැති නිලධාරියා හමුවන ලෙසට දන්වා තුන්ඩුවක් ලබාදුන් බවත්, ඒ අනුව 2016.06.30 වන දින උදෑසන 9.30 ට පමණ තමාත් පැමිණිලිකාරියත් අගතියට පත් තැනැත්තියත් වාද්දුව පොලිස් ස්ථානයට ගොස් සුනෙත් නැමැති නිලධාරියා හමුවූ බවත්, එම නිලධාරියා පෙර දින තම නිවසට පැමිණි නිලධාරියා බව හඳුනාගත් බවත්, තමා සහ පැමිණිලිකාරිය ඉන් ඉවත් කර ප්‍රියංකා යන අයව කාමරයකට රැගෙන ගිය බවත්ය. පසුව ප්‍රියංකා යන අය හෘද රෝගියෙකු වන බැවින් ඇයගේ බෙහෙත් පෙති නිලධාරියාගෙන් විමසා බීමට දී මාළුපාන් ගෙඩියක්ද ලබාදුන් බවත් සඳහන් කර ඇත. එම නිලධාරියා තමාගෙන් ‘ෆ්‍රිජ් එක ගෙනාපු රිසිට් කෝ’ යැයි විමසූ අතර, තමා ඒවා පෙන්වා සිටි බවත්, ලෝන් එක අරගෙන ගේ හදන බවද තමා විසින් ඔහු වෙත දන්වා තම බැංකු පොතද පෙන්වා සිටි බවත් සඳහන් කර ඇත. ප්‍රියංකා ගෙන යන ලද කාමරය තුළ පිරිමි 9 දෙනකු පමණ සිටි අතර, එහි අනිල් යන අය සහ ඔහුගේ බිරිඳද සිටි බවත්, සුනෙත් නිලධාරියා විසින් ‘මේකි පවුල් කඩනවා’ කියා බැණ වැදුනු බවත්, එවිට තමා ‘ඇය දරුවන්ට කන්න දෙන්නේ බත් විකුණලා, මිනිහා දාලා ගියාට එයා ඒ වගේ කෙනෙක් නෙමෙයි සර්’ කියා ප්‍රකාශ කළ බවත්, සඳහන් කර ඇත.

පැයකට පමණ පසු නැනාව ගෙනියන්න ඕනෑ නම් රු. 3000/- ක් දීලා අරන් පලයන් කියා පැවසූ බවත්, තමා ‘ඇයි සර්’ කියා ඇසූ විට පරුෂ වචනයෙන් බැණ වැදුනු බවත්, ‘අපට නීති උගන්වන්න හදනවාදැයි’ විමසා ‘එසේ නොවුනහොත් අධිකරණයට ඉදිරිපත් කරන බවට’ පවසා සිටි බවත්, ඉන් පසුව තමාත් අම්මාත් පානදුර අධිකරණයට ගොස් නීතිඥවරයෙකු හමුවී මානව හිමිකම් කොමිෂන් සභාවටත්, පොලිස්පතිවරයාටත්, පොලිස් කොමිෂන් සභාවටත් ෆැක්ස් මඟින් පැමිණිලි කළ බවත් ප්‍රකාශ කර ඇත. ඉන් පසුව සවස 3.00 ට පමණ තමාත් අම්මාත් වාද්දුව පොලිස් ස්ථානයට ගිය නමුත්, නංගී එහි නොසිටි බවත්, පසුව නංගීව පොලිස් ත්‍රීරෝද රථයේ දමාගෙන පන්සල අසලට ගෙනවිත් බස්සවා ඇති බවට දැනගත් බවත් සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

පැමිණිල්ල සම්බන්ධයෙන් 2016.09.01 වන දින විමර්ශනය සඳහා පාර්ශවයන් කැඳවා ඇති අතර, එහිදී ප්‍ර.පො.ප සුනෙත් ශාන්ත මහතා ප්‍රකාශ කර ඇත්තේ, පානදුර දකුණ පොලිස් ස්ථානයට බල අපරාධ 121/16 යටතේ වාර්තා වී තිබූ පානදුර නල්ලූරුව විහාරස්ථානයේ රු. ලක්ෂ 12 කට ආසන්න මුදලක් සොරකම් කිරීම සම්බන්ධයෙන් සැකකරුවෙකු සහ සැකකාරියක් 2016.06.30 දින අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ බවයි. ඊට අදාළ විමර්ශනයේදී, නල්ලූර් විහාරස්ථානය අසල පදිංචි ප්‍රියංකා නැමැති අයකුට මෙහි සැකකරුවෙකු වන අනිල් නැමැති අය විසින් සොරාගත් මුදල් සහ එම මුදලින් ලබාගත් දේපළ ලබාදී ඇති බවට අනාවරණය වූ අතර, ඉන් පසුව මෙම ප්‍රියංකා නැමැත්තියට 2016.06.30 දින වාද්දුව පොලිස් ස්ථානයේ පිහිටි දිසා අපරාධ ඒකකය වෙත පැමිණෙන ලෙසට දැනුම්දුන් බවත්, පසුව ඇයගෙන් මේ සම්බන්ධයෙන් විස්තර විමසූ විට ඇයට රු. 3000/- ක මුදලක් මෑත කාලයේදී සැකකාර අනිල් යන අය විසින් ලබාදුන් බවට පිළිගත් බවත්, එම නිවසට මෑතකදී ශීතකරණයක් මිළදී ගත් බවට කරුණු අනාවරණය වූ අතර, ඒ සම්බන්ධයෙන් සොයා බැලීමටත් ප්‍රකාශයක් සටහන් කර ගැනීමටත්

අවශ්‍ය බැවින් ඇයගේ ප්‍රකාශයක් සටහන් කොට ඇයව මුදා හැර අත්අඩංගුවට ගත් සැකකරුවන් පානදුර දකුණ පොලිස් ස්ථානයට ඉදිරිපත් කළ බවත් සඳහන් කර ඇත.

විමර්ශනයේදී අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු ලබා දෙමින්, අදාළ නිවස සම්පූර්ණයෙන් පරීක්ෂා නොකළ බවත්, ප්‍රියංකා නැමැත්තිය විසින් මෙම අපරාධයට අදාළ මුදල් වලින් දේපළ මිළදීගෙන ඇත්ද යන්න සම්බන්ධයෙන් සොයා බැලූ අතර, ඇයගේ මව විසින් මෑත කාලයේදී රු. 70,000/- ක මුදලකට ශීතකරණයක් මිළදී ගෙන ඇති අතර, එය නිවසේ තිබූ බවත්, එම අවස්ථාවේදී ලේඛන පරීක්ෂාවක් නොකළ බවත් සඳහන් කර ඇත.

තවද වාද්දූව පොලිස් ස්ථානයට ඉදිරිපත් වූයේ සවස 2.00 ට පමණ බවට සඳහන් කරන අතර, අදාළ ලියවිලි පරීක්ෂා කිරීම සඳහා පොලිස් රථයක ඇයව දමාගෙන ඇයගේ නිවසට නොගිය බවද ප්‍රකාශ කර ඇත. තවද පැමිණිලිකාරිය අත්අඩංගුවට ගැනීමක් නොකළ බවද කිසිදු අවස්ථාවක ඇයට මානසික පීඩනයක් නොකළ බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකාරියගේ දියණිය වන ඩබ්.සී ප්‍රියංකා චමින්දනී යන අයට පානදුර දකුණ අපරාධ විමර්ශන අංශය විසින් පැමිණෙන ලෙසට දැන්වීමක් කර ඇති අතර, ඒ අනුව එම අය 2016.06.30 වන දින පොලිස් ස්ථානය වෙත ගොස් ඇත. ඒ සම්බන්ධයෙන් එදිනම පැය 14.35 ට ෆැක්ස් පණිවිඩයක් මඟින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම්දීම් කර ඇත.

වගඋත්තර පාර්ශවීය වාර්තාව සහ කරුණු දැක්වීමට අනුවද ප්‍රියංකා චමින්දනී නැමැති අයව 2016.06.30 දින පොලිස් ස්ථානයට කැඳවා ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති බව පෙනේ.

මෙහිදී ඇයට පරුෂ වචනයෙන් බැන වැදී ඇයගේ කතා කිරීමේ අපහසුතාවය මත ඇයට අපහාස වන ආකාරයට කටයුතු කළ බවට සඳහන් වුවද, ඇය විමර්ශනයේදී සඳහන් කර ඇත්තේ, පරුෂ වචනයෙන් නොබැන්න බවත්, නමුත් තමාගේ කතා කිරීමේ අපහසුතාවය හුවා දැක්වෙන පරිදි කතා කරමින් ඇයට කොළොප්පම් කළ බවත්ය.

මේ අනුව විමර්ශන අවස්ථාවේදී නිලධාරීන් විසින් ඇයගේ ශාරීරික ආබාධය යොදා ගනිමින් ඇයට අපහාස වන ආකාරයට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

වගඋත්තරකරුවන්ට අදාළ අපරාධය සම්බන්ධයෙන් අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 109 යටතේ පැමිණිල්ලක් නැතහොත් මුල් තොරතුරක් ලැබී ඇති අවස්ථාවක ඊට අදාළ විමර්ශනය සඳහා කැඳවීම, ප්‍රකාශ සටහන් කිරීම සඳහා බලය ලැබී ඇත. ඒ අනුව අගතියට පත් තැනැත්තියව පොලිස් ස්ථානයට කැඳවා ප්‍රකාශයක් ලබාගැනීම තුළින් අත්අඩංගුවට ගැනීමක් සිදුව නොමැති බැවින් නීති විරෝධී අත්අඩංගුවට ගැනීමක් සිදුවූ බවට කරුණු තහවුරු නොවේ.

කෙසේ වෙතත්, පැමිණිලිකාරිය අනවශ්‍ය ලෙස පොලිස් ස්ථානයේ රඳවා තබා ගැනීමෙන් සහ අකුරු කියවීමට නොහැකි නමුත් ප්‍රකාශයක් ලබාගෙන එහි කරුණු පැහැදිලි නොකිරීමෙන් අත්අඩංගුවට ගැනීමක් සිදු නොකළද ඇයගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුව ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණයයි.

තවද පොලිස් විමර්ශනය තුළදී පොලිස් භාරයේ සිටින කාන්තාවකට මෙන්ම ආබාධිත අයෙකුට ඇයගේ ආබාධය මත ඇයට අපහාස සහ අවමන් සහගත වන ආකාරයට සැළකීම තුළින් ඇය මානසික හිංසනයකට ලක්ව ඇති බවට

ඉදිරිපත් වී ඇති කරුණු අනුව සනාථ වන බැවින් එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලබයි.

**නිර්දේශය :-**

01. ඒ අනුව වගඋත්තරකාර ප්‍ර.පො.ප සුනෙත් ශාන්ත යන අය විසින් මෙම අගතියට පත් පාර්ශවය වෙත රු. 3,000/- ක මුදලක් ගෙවීමට කටයුතු කළ යුතුය.

02. තවද වගඋත්තර පාර්ශවයේ මෙකී ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා සහ මෙම නිර්දේශය අදාළ වකවානුව තුළ වාද්දුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙත යොමු කිරීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති සහ අධ්‍යක්ෂ (නීති), පොලිස් නීති කොට්ඨාශය වෙතද යොමු කරනු ලැබේ.

2021 .11 .26 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මහාචාර්ය/ආචාර්ය ජ.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :-

01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. අධ්‍යක්ෂ (නීති),
පොලිස් නීති කොට්ඨාශය,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

} ඉහත 02 නිර්දේශය අනුව කටයුතු කිරීමට

සැ.යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැළැස්විය යුතුය.

B/